කොළඹ විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය

**පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (සති අන්ත) පාඨමාලාව**

**2019/2020 (සිංහල මාධ්‍ය)**

2019/2020 අධ්‍යයන වර්ෂය සඳහා සති අන්තවල සහ අවශ්‍ය පරිදි වෙනත් නිවාඩු දිනවල පැවැත්වෙන පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව සඳහා රජයේ පාසල්වල හෝ පුද්ගලික පාසල්, පිරිවෙන් සහ අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති වෙනත් ආයතනවල හෝ සක්‍රිය සේවයේ නිරත වෙමින් සිටින උපාධිධාරීන්ගෙන් (අධ්‍යාපනවේදී නොවන) අයදුම්පත් කැඳවනු ලැබේ. පාඨමාලාව 2019 පළමු වාරය තුළ ආරම්භ කිරීමට අපේක්ෂිතය.

**තෝරා ගැනීම :**

ලිඛිත පරීක්ෂණයක් (අපේක්ෂිත අයදුම්කරුවන් සංඛ්‍යාවට වඩා වැඩි වුවහොත්) හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

**මධ්‍යස්ථානය :**

මෙම පාඨමාලාව කොළඹ දී පමණක් පැවැත්වේ.

**ගාස්තු :**

පාඨමාලාව සඳහා ඉල්ලුම් කිරීමේ ගාස්තුව රු. 600/- කි.

පාඨමාලා ගාස්තුව රු 76,500/- කි.

**අයදුම් කිරීමේ උපදෙස්:**

තම පුද්ගලික ලිපිනය ලියූ රු. 15.00ක මුද්දර ඇලවූ සෙ.මී. 22x10 ප්‍රමාණයේ ලියුම් කවරයක් 2019.01.18 දිනට පෙර පහත සඳහන් ලිපිනයට එවීමෙන් හෝ අන්තර්ජාලය හරහා https://edu.cmb.ac.lk/ මගින් පාඨමාලාව සඳහා ඉල්ලුම් කිරීමට අවශ්‍ය ඉල්ලුම් පත්‍රය, විස්තර පත්‍රිකා සහ ගෙවීම් උපදෙස් ලබාගත හැකිය.

සම්බන්ධීකාරක - සති අන්ත ඩිප්ලෝමා පාඨමාලාව 2019/2020
අධ්‍යාපන පීඨය,
කොළඹ විශ්වවිද්‍යාලය,
කොළඹ 03.

සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත් පීඨය වෙත ලැබිය යුතු අවසන් දිනය 2019.02.08.

***මෙම පාඨමාලාව සඳහා පීඨය මගින් නිකුත් කෙරෙන ඉල්ලුම් පත් මගින් පමණක් ඉල්ලුම් කළ යුතු වේ.***

ලේඛකාධිකාරී
කොළඹ විශ්වවිද්‍යාලය,

2018.12.07